www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සුනාමි ව්‍යසනයේ සමාජ මූලයෝ

## The social roots of the tsunami disaster

**කර්තෘ මන්ඩලය විසිනි**
**2005 ජනවාරි 22**

සුනාමි ව්‍යසනය විසින් ඇති කරන ලද මහා විනාශය නොවැලැක්වියහැකි අනිවාර්යයක් නො වී ය; විනාශය වනාහී ලාභ ගරන ධනේශ්වර පද්ධතියේ අමානුෂික බව බලගතු ලෙස විදහා දැක්වීමකි. එය සුනාමියේ තත්ක්ෂනික හේතු දැනට මනුෂ්‍ය වර්ගයාට පාලනය කල නොහැකි වූ ස්වාභාවික බලවේගයන් තුල පැවැති බව සත්‍යයකි. එහෙත් සිදු වී ඇති දුක, මරනය සහ විනාශයෙන් අතිමහත් වැඩි පංගුවක් වලක්වා ලීමේ හැකියාව මුලුමනින්ම නූතන තාක්ෂනයේ කඩඉම් තුල පැවැතියේ ය.

සුනාමිය සහ එයට හේතු වූ භූමිකම්පාව පැසිෆික් සාගර සීමාව තුල පුපුරා ගියේ නම්, විපාක මීට වඩා බෙහෙවින් වෙනස් වීමට ඉඩ තිබුනි. විශේෂයෙන්ම උතුරු ඇමරිකාවේ ද ජපානයේ ද මුහුදුකරය ආරක්ෂා කිරීමට තැනුනු කල්තබා අනතුරු හැඟැවීමේ අධි තාක්ෂන පද්ධතියක් දශක ගනනාවක් තිස්සේ ක්‍රියාත්මකව තිබුනි. ප්‍රථම අනතුරු හැඟැවීම් ප්‍රාරම්භක භූ චලනය සිදු වී මිනිත්තු ගනනාවක් ඇතුලත සිදු කල හැකිව තිබුනි. මනුෂ්‍යයන් විශාල සංඛ්‍යාවක්, විශේෂයෙන්ම දුප්පත්ම කොටස්, විනාශකාරී බලපෑමට අනිවාර්යයෙන්ම හසුවීම සිදු වනු ඇති නමුත් අතිමහත් බහුතරයක් ජීවිත ද ප්‍රානභූත පොදුකාර්ය පිරිවැය ද බොහෝදුරට බේරා ගත හැකිව තිබුනි.

එහෙත් අනතුරු ඇඟවීම් ක්‍රමයක් ඉන්දියානු සාගරය අසබඩ රටවල් තුල පැවැතුනේ නැත. එහෙයින් සුනාමිය මුලුමනින්ම නුසුදානම් වූ ජනගහනයක් මතට කඩා පාත් විය. වඩාත්ම එහි ගොදුරු වූවෝ දුප්පත්කම නිසා කිසිදු ආරක්ෂාවක් නොලැබ මුහුදුකරයේ අබලන් පැල්පත්වල වාසය කිරීමට සිදු වී තිබුනු ජනතාව ය. මොවුන්ට කිසිදු අනතුරු හැඟැවීමක් නො ලැබුනා පමනක් නොව, අධිකාරීන් සුනාමි අනතුරක් අත ලඟ එන බව අඟවන ලකුනු හඳුනා ගත හැක්කේ කෙසේ දැයි ඔවුන්ට කියා දී තිබුනේ ද නැත. ජනයා සිදුවෙමින් තිබුනේ කුමක්දැයි සිතාගැනීමටත් නොහැකිව සිටිය දී සම්පූර්න නගර සහ ගම් සමතලා කරනු ලැබිනි: ඒවායේ වැසියෝ අතුගා දමනු ලැබූහ.

ආසියාව සහ අප්‍රිකාව පුරා දස ලක්ෂ සංඛ්‍යාත ජනකායට මුහුන දීමට සිදුවූ භයංකර විපත්තිය ඉතාම ප්‍රාථමික යටිතල පහසුකම් පවා නො තිබීම නිසා තවත් උග්‍ර විය. බලපෑමට හසුවූ රටවල මූලික සේවා - ප්‍රවාහනය, ජන සංනිවේදනය, විදුලිය සහ ජලය - සම්පාදනය කිසිසේත්ම සෑහෙන තත්වයක තිබුනේ නැත. ව්‍යසනය ඉක්බිත්තේ හදිසි සේවා හා සෞඛ්‍ය සේවා මුලුමනින්ම අසමර්ථව ගියේ ය. දැන් දස ලක්ෂ සංඛ්‍යාත ජනකායකට ජීවිතයේ මූලික අවශ්‍යතා අහිමිව ගොසිනි. සිද්ධියෙන් සති හතරක් ගත වූ පසුව ද සහන සේවකයෝ සමහර ඈත ප්‍රදේශවලට යාගැනීමට නොහැකිව සිටිති.

ලෝකයේ ප්‍රමුඛ අගනුවරවල ආන්ඩු මීට දැක්වූ ප්‍රාරම්භක ප්‍රතිචාරය ඊනියා තුන්වන ලෝකයේ මහා ජනයා මුහුන දී ඇති තත්වය කෙරේ පාලක ප්‍රභූන්ගේ පිලිකුල සහ නොතැකීම විදහා දැක්වී ය. සාමාන්‍ය ජනකාය දැක්වූ උතුරා ගිය අනුකම්පාව සහ ත්‍යාගශීලී බවට කටුක ලෙස ප්‍රතිකූල වූ, ඇමරිකානු ජනාධිපති බුෂ් ද, බ්‍රිතාන්‍ය අගමැති බ්ලෙයාර් ද තමන්ගේ නිවාඩු දින සැලසුම් වෙනස් කිරීම වත් අවශ්‍ය යැයි නොසිතුවෝ ය. කල් මරා කල ඔවුන්ගේ ප්‍රකාශ එලියට ආවේ, ඔවුන් විසින් දක්වන ලද නොතැකීම ඔවුන්ට බරපතල දේශපාලන අවාසි ගෙනදීමට තර්ජනය කල තතු තුල ය.

ඔවුන්ගේ හැසිරීම්වල කිසිදු අහඹුබවක් තිබුනේ නැත. ඒවා පිලිබිඹු කලේ පීඩිත හා පීඩක ජනතාව අතර පවත්නා වූද දිනපතා ක්‍රියාත්මක වන්නා වූද අති මූලික ආර්ථික සබඳතාවන් ය. ප්‍රමුඛ අධිරාජ්‍යවාදී රටවල ඉතා කුඩා ප්‍රභූවක් විසින් එක්රැස් කර ගෙන තිබෙන අතිමහත් ධන සම්භාරය වනාහී ආසියාවේ, අප්‍රිකාවේ සහ වෙනත් රටවල ලාභ කම්කරු ශ්‍රමය සූරා කෑම මගින් ගොඩ ගසාගෙන ඇති ලාභ කන්දරාවේ ප්‍රතිඵලයකි. දියුනු රටවල දේශපාලන, මූල්‍ය සහ කාර්මික ප්‍රභූවේ සුඛ විහාරී ජීවන රටාව රඳා පවත්නේ දුප්පත්ම රටවල ලක්ෂ සංඛ්‍යාත ජනකාය සදාකල්හිම දිලිඳුබවේ ගිල්වා තැබීම මත ය.

මෙම සම්බන්ධතාවය ඉස්මත්තට ගෙන එන බොහෝ සංඛ්‍යා ලේඛන පවතී. පසුගිය වර්ෂයේ ඩොලර් බිලියනපතියන් වාර්තාගත 587ක් ලෝකයේ සිටි බව ද, ඉන් අඩකට වඩා ඇමරිකා එක්සත් ජනපදය තුල බව ද, *ෆෝර්බ්ස්* සඟරාව එලිදරව් කලේ ය. ඔවුන්ගේ ඒකාබද්ධ ධනය ඩොලර් ට්‍රිලියන 1.9ක් (බිලියන 1,900ක්) වීය. -(මෙය වනාහී එක්සත් ජනපද ආන්ඩුව විසින් සුනාමි ආධාර වසයෙන් පිරිනමන ලද ඩොලර් 350 මිලියනය මෙන් 5430ස් ගුනයකි. -

පරිවර්තක) - එම මුදල ලෝකයේ දිලිඳුම රටවල් 170ක ඒකාබද්ධ දල දේශීය නිෂ්පාදිතයේ වටිනාකමට වැඩි ය. මෙයට ප්‍රතිසන්ධනාත්මකව අඩු ගනනේ එක් බිලියනයක් ජනයා (ලෝක ජනගහනයෙන් 1/6 ක් පමන) ජීවිතයේ මූලික අත්‍යාවශ්‍ය දැයින් පවා තොරව ''ආන්තික දිලිඳු බවේ'' ගැලී ජීවත්වන බව ද ඔවුන්ගේ තත්වය එන්න එන්නම නරක අතට හැරෙමින් පවත්නා බව ද එක්සත් ජාතීන්ගේ වාර්තාවක් විසින් සොයා ගනු ලැබිනි.

එක්සත් ජනපදයද, බ්‍රිතාන්‍යද වෙනත් අධිරාජ්‍යවාදී රටවල්ද සම්බන්ධයෙන් ගතහොත් ශ්‍රී ලංකාවේ හා ඉන්දුනීසියාවේ තමන්ට තිබුනු සියල්ල, පවුලේ සාමාජිකයන්, නිවාස, සහ ජීවනෝපාය නැතිව ගිය ජනකාය ඉමහත් විය; එහෙත් එම නස්පැත්තිය ලෝක ධනේශ්වර ක්‍රමයේ ක්‍රියාකාරිත්වයට දරන්නේ අවශිෂ්ට අර්ථයක් පමනි. ව්‍යසනයට පත්වූවන්ගේ ඉරනම එතරම් අදාල කරුනක් නොවේ යයි සලකනු ලබන්නේ ද එහෙයිනි. ස්වාභාවික ව්‍යසනයන් විසින් ආසියාව නිරතුරුවම විනාශභාග් කෙරන බව සියල්ලෝම දනිති. මහා ගං වතුර, සුලිසුලං මිනිසුන්ගේ නිවාස හා ජීවිත අතුගා නොදැමෙන අවුරුද්දක් ඇත්තේ නැත. එහෙත් මහජනතාව ඒවාට ගොදුරුවන තරම අඩුකර දැමීමට කවර කලෙකවත් කිසිවක් නො කරනු ලැබේ.

ලෝකයේ මූල්‍ය ප්‍රවෘත්ති ප්‍රකාශන සුනාමි විපතේ බලපෑම පිලිබඳව සැනසුම් සුසුමක් හෙලමින් මේ පිලිබඳ තම ආකල්පය සාරාංශ කලාහ: ''අසේ ප්‍රාන්තයේ තෙල් හා ගෑස් පිලිබඳ ප්‍රමුඛ ආයෝජනවලට බලපෑමක් සිදු වූයේ නැත. විපතට පත්වූවන්ගේ දුප්පත්කම නිසාම, රක්ෂනය වී සිටි සංඛ්‍යාව අඩු වූ තතු තුල රක්ෂන සමාගම්වලට ගෙවන්නට සිදු වූ වන්දි ඉතා සීමිත විය. සංචාරක ව්‍යාපෘතියට පාඩු සිදු වූ නමුත් එය ඉක්මනින් පිරිමසා ලීමට හැකි විය.''

ලෝකය පුරා — ආසියානු ප්‍රදේශයේ ද ඇතුලුව කොටස් වෙලඳපොලවල් — මෙම සිද්ධියට සංවේදී වූයේ නම් ඒ යන්තමින් පමනි. සුනාමි බලපෑමට හසු වූ රටවල ප්‍රාදේශීය ජනකාය සූරාකෑමට ප්‍රමුඛ ජාත්‍යන්තර සමාගම්වලට උදව්කල කොටස් පමනක්ම ඒ රටවල විදේශ ආයෝජන ප්‍රමානය ඉහල යාම මගින් වාසි ලබා සිටිති. අති මහත් බහුජනතාව ගැන සලකා බැලුවහොත් ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ගෝලීය ප්‍රාග්ධනය වෙනුවෙන් පටවා තිබෙන පුද්ගලීකරන සහ ප්‍රතිව්‍යුහකරන වැඩ පිලිවෙල විසින් ඔවුන්ව බඳුන්කර ඇත්තේ ජීවන තත්වයන් තවතවත් විනාශ වී යාමට ය.

ආර්ථික සූරාකෑම දේශපාලන මර්දනය සමග අතිනත ගෙන ගමන් කරයි. ආසියාව පුරා, ජාතික ධනේශ්වරය සමත්ව ඇත්තේ මෙම සබඳතා පවත්වාගෙන යාමටත්, මිලිටරි ඒකාධිපතිත්වය සහ මහජනතාව ප්‍රජාගනවාදයෙන් හා සිවිල් යුද්ධයෙන් බෙදා දැමීම මගින්, බලයේ එල්බී සිටීමට පමනි.

## "ආධාර" පොරොන්දුවලට පිටුපසින්

සතියක්ම සුනාමි ව්‍යසනය නොතකා හැර සිටි ප්‍රධාන බලවත්තු හිටි අඩියේ කරනමක් ගැසූහ. ජාකර්තාහි පැවැත්වුනු ජාත්‍යන්තර සමුලුවක් ආධාර වසයෙන් ඩොලර් බිලියන 5ක් පොරොන්දු විය. මෙය වනාහි දායක රටවල අයවැය හා සසඳා බලන කල්හි සොච්චමකි; දස ලක්ෂ ගනන් සුනාමියට ගොදුරුවූවන්ගේ අවශ්‍යතා සම්බන්ධයෙන් ගතහොත් අල්ප පංගුවකි. එහෙත් ඊටත්වඩා අරුත්බර වන්නේ එක්සත් ජනපදය සහ ඕස්ට්‍රේලියාව ව්‍යසනයට දරුනුම ලෙස ගොදුරු වූ ඉන්දුනීසියාවේ හා ලංකාවේ ''සහන'' වැඩ කටයුතු සඳහා යුද්ධ හමුදා යැවීම ය.

හිටි අඩියේ සිත වෙනස් කර ගැනීමක් යයි පෙනීගිය මේ හැසිරීම නිශ්චිත වසයෙන්ම මෙහෙයවනු ලැබුවේ පන්ති අවශ්‍යතාවලිනි. තමන්ගේ ප්‍රාරම්භක, අතිශයින්ම කැපී පෙනුනු නොතැකීම වසන්කර දැමීම සඳහා මහා මහජන සම්බන්ධතා අභ්‍යාසයකට, අමතරව බුෂ්, බ්ලෙයාර් සහ හොවාර්ඩ් මෙම ව්‍යසනය තමන්ගේම ආර්ථික හා මූලෝපායික අරමුනු ඉටු කර ගැනීමට උදව් වේ යයි සිතූහ.

ධවල මන්දිරය මෙය ගත්තේ ඉරාකය නව-යටත්විජිතවාදීව අල්ලාගෙන සිටුනා එක්සත් ජනපද මිලිටරියට ''මානව හිතවාදී මුහුනත'' පැලැන්දීම සඳහා යොදා ගැනීමට අවස්ථාවක් ලෙස ය.

ජනාධිපති බුෂ් කොන්ඩලීසා රයිස් ව ජනාධිපති ධුරයට පත් කිරීම තහවුරු කිරීම සඳහා සෙනේට් මන්ත්‍රීමන්ඩලයේ විදේශ සබඳතා කමිටුව විසින් පවත්වන ලද සාක්කි විමසීමේ දී රයිස් ප්‍රකාශ කර සිටියේ සුනාමිය,''හුදෙක් එක්සත් ජනපද ආන්ඩුවට පමනක් නොව ඇමරිකානු ජනතාවගේ හදවත විදහා දැක්වීමට මා හැගි අවස්ථාවක් සම්පාදනය කර දුන්නේ ය'' යි කියා ය. ''එය අපට ඉමහත් ලාභාංශයක් ලබා දී ඇතැයි'' ද ඈ කීවා ය. වියට්නාම් යුද්ධයෙන් ඉක්බිති දකුනු ආසියාවේ විශාලතම ඇමරිකානු යුද හමුදා කාවැදීම සඳහා අවස්ථාවක් සුනාමිය විසින් සපයා දෙනු ලැබිනි.

එක්සත් ජනපදය මහජන විරෝධය ඇවිලෙතැයි දක්වන බිය නිසා, මේ වන තෙක් ''ත්‍රස්තවාදී විරෝධී යුද්ධය'' නමින් තම අරමුන දිනා ගැනීම සඳහා මෙම ප්‍රදේශවල සිය හමුදාව යොදා ගැනීමට පසුබා සිටියේ ය. දැන් කෙසේ වෙතත් එක්සත් ජනපද හමුදා ශ්‍රී ලංකාවේ ද, ඉන්දුනීසියාවේ ද බැසගෙන සිටිති. මේ රටවල් දෙකම මැදපෙරදිග ද ආසියා-පැසිෆික් ප්‍රදේශය ද අතර පිහිටා ඇති හෙයින් එක්සත් ජනපද මිලිටරි මූලෝපායඥයන් විසින් තීරනාත්මක යයි කලක් තිස්සේ සලකනු ලැබිනි.

සුනාමිය ඇමරිකා එක්සත් ජනපදයට ඉන්දුනීසියාවේ යුද හමුදාව සමග සමීප සබඳතාවයක් තහවුරු කර ගැනීමට අවස්ථාව සලසා දී ඇත. සුහර්තෝ වැටීමෙන් පසුව, එක්සත් ජනපදයට

ඉන්දුනිසියානු හමුදාවෙන් ද එම හමුදාවේ මුර්ග මර්දන වාර්තාවෙන් ද ඇත් වීමට බල කෙරුනි. දැන් එක්සත් ජනපද හටයෝ බෙදුම්වාදී කැරලිකරුවන් සුන්කර දැමීම සඳහා ද අචිනීස් ප්‍රාදේශීය ජනතාව බියවැද්දීම සඳහා ද ආන්ඩුවේ හමුදා සමග අතිනත්ගෙන යුද වැද සිටිති. ඔවුන් එසේ කරන්නේ ඉන්දුනිසියානු හමුදාව බෙදුම්වාදී කැරලි කරුවන් කුඩුකොට අචිනීස් ජනයා ත්‍රස්තයට භාජන කරමින් සිටින තතු තුල ය.

මූල්‍ය ආධාර සලකා බැලුවොත් සෑම ඩොලරයක්ම එන්නේ බැඳීම් ද සහිතවය. යලි ගොඩ නැගීමේ වැඩවල දී තැනීමේදී බෙදා දීමට යන ලාභදායී කොන්ත්‍රාත්තු අල්ලා ගැනීම සඳහා බොහෝ ගොඩනැගිලි සමාගම් දැනටම පෝලිමට එක්ව සිටිති. ඕස්ට්‍රේලියානු ආන්ඩුව ඉන්දුනිසියාවට දී ඇති ඩොලර් එක් බිලියනයෙන් සෑම ඩොලරයක් ම බෙදනු ඇත්තේ ඉන්දුනිසියානු සමාන්තර නිලධාරින් සමග එක්ව ජාකර්තා හි දැන් සිටින ඕස්ට්‍රේලියානු නිලධාරින් විසින් යයි ද ඒවා බෙදනු ඇත්තේ එක්සත් ජාතීන් ගේ නියෝජිතයන් විසින් නොවේ යයි ද ඕස්ට්‍රේලියානු ආන්ඩුව අවධාරනය කර තිබේ. මෙය අනිකුත් වාසිවලට අමතරව, මුලින්ම ලාභ ලබන්නේ ඕස්ට්‍රේලියානු සමාගම් යයි සහතික කරනු ඇත.

සුනාමියට ගොදුරු වූවන්ට ලැබෙන්නේ අවම තැකීමකි. මුලුමහත් සහන මෙහෙයුමට යටින් ගම්‍යව පවත්නා ප්‍රස්තුතය නම්, සුනාමියට ගොදුරුවූවන් තමන්ට දැන් ලැබෙන ඕනෑම දෙයක් ගැන ස්තුතිවන්ත විය යුතුය යන්න ය.

දියුනු ධනේශ්වර රටවල ගවපට්ටිවල වත් දක්නා නොලබන තත්වයන් සහිත රංචුගැසී තදබදව ගිය අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් වත් නැති ජල පහසුකම් නැති දහජරාව පිරි කඳවුරුවල සුනාමියට ගොදුරුවූවන් සඳහා අවුරුදු දෙකකටත් වැඩි කාලයක් තබා ගැනීමට සැලසුම පවතී.

ඉන්පසු ඔවුන් තමන්ගේ අතීත ජීවිතවලට - එනම් අතින් කටට පන ගැටගසා ගැනීමට යලි ඇද වැටෙනු ඇත. බොහෝ විට සමහරුන් පෙර මෙන් ම මුහුදු කරයේ ව්‍යසනවලට ගොදුරු වන තත්වයන්ට ඇද දමනු ඇත.

දැන් නම් ඉතින් ඉන්දියානු සාගර කලාපයේ ද සුනාමි අනතුරු හැඟවීම් කේන්ද්‍රයක් පිහිටුවෙනු ඇත. එහෙත් ජල ගැලුම්, කුනාටු, සහ වෙනත් ස්වභාවික ව්‍යසන විසින් ඇති කරනු ලබන වාර්ෂික ජීවිත විනාශයට හේතු භූත වී ඇති තත්වයන් අහෝසි කිරීමට කිසිවක් කෙරෙනු නැත.

දෙසැම්බර් 26 ඛේදවාචකය යලිත් වරක් පසුගිය ශතවර්ෂයේ ලත් දැවැන්ත විද්‍යාත්මක වර්ධනය ද දස ලක්ෂ ගනන් ජනීජනයාට ජීවත්වීමට සිදුකර ඇති පසුගාමීත්වය ද අතර අසමානතාව ඉස්මත්තට ගෙනවුත් තිබේ. පසුගිය දශක දෙක තුල නිෂ්පාදනයේ භූගෝලීකරනය මානව වර්ගයාගේ ආර්ථික ධාරිතාව ඉහල නංවා හේතු යුක්ත ආකාරයකට ලෝක පරිමානව සම්පත් සැලසුම් ක්‍රියාත්මක කර ලෝකයේ සෑම තැනකම ජීවත්වන ජනයාට යහපත් ජීවන තත්වයක් භුක්ති විඳීමට හැකි තතු නිර්මානය කර තිබේ.

එහෙත් ලාභ ගරන ධනේශ්වර පද්ධතිය ලොව පවත්නාතාක් කල් මෙය කෙහොමවත් ඉටු කරගත නොහැකි ය. ධනවතුන් හා දුප්පතුන් අතර පවත්නා යෝධ අගාධය වනාහී ධනවාදයට ආවේනික වූ සම්බන්ධයන්ගේ විපාකය යි. අතලොස්සකගේ ලාභ ගැරිල්ලට ඉහලින් බහුජනතාවගේ අත්‍යවශ්‍ය උවමනාකම් තැබෙන සමාජවාදී පිලිවෙත් උඩ සමාජය ප්‍රතිව්‍යුහගත කිරීම මගිනි සමාජ අසමානතාවය අහෝසි කර දැමිය හැක්කේ.

© www.wsws.org